# අසිරිමත් පොතක්

# THE WONDERFUL BOOK

දෙවියන් වහන්සේ නොයෙක් ආකාරයෙන් අප අමතන සේක. දේශකයෝ උන්වහන්සේගේ වචන වලින් දේශනා කරන්නාහ. උන්වහන්සේට ප්‍රශංසා කිරීම සඳහා ගී සිංදු ප්‍රබන්ධ කොට ඇත. උන්වහන්සේගේ වචනය ලෙස අප හඳුනා ගන්නා අභ්‍යන්තර විශ්වාසය ඔස්සේ උන්වහන්සේ අපගේ හදවත් හා සංවාදයෙහි යෙදෙන සේක. අප පිළිබඳව උන්වහන්සේ තුළ ඇති අපේක්ෂාවන් හා සිතිවිලි ගැන අප සැක පහළ කළ යුතු නැත. අපට මග පෙන්වීම සඳහා උන්වහන්සේගෙන් විශිෂ්ඨ ත්‍යාගයක් ලැබී තිබේ. ඒ උන්වහන්සේගේ වචනයයි. ඒ අපගේ බයිබලයයි.

" ඔබගේ වචන මාගේ පාදයන්ට පහනක්ය. මාගේ මාවතට එළියක්ය...... "
ගීතාවලිය (119:105)

ස්වර්ගයෙහි අපට ඉඩක් සාදා ගැනීම සඳහා යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ස්වර්ගස්ථ වූ සේක. එහෙත් අපට මග පෙන්වීමක් හෝ අස්වැසිල්ලක් ඉතිරි නොකොට උන්වහන්සේ එහි වැඩම කළේ නැත. උන්වහන්සේගේ වචනය උන්වහන්සේගේ ආත්මය ස්වර්ගයේ ඇති අපගේ නිවහන කරා යාමට අපට මග පෙන්වයි.

ඔබේ බයිබලය වඩාත් හොඳින් පාවිච්චි කිරීමට උදවුවන සාධක කිහිපයක් ඇත. බයිබලය නව තෙස්තමේන්තුව හා පැරණි තෙස්තමේන්තුව යනුවෙන් කොටස් දෙකකි. දෙවියන්වහන්සේ විසින් මිනිසා සමග ඇති කර ගන්නා ලද ගිවිසුමක් ඒ එක් එක් තෙස්තමේන්තුවේ දක්වා ඇත. තෙස්තමේන්තු දෙකටම අයත් පොත් රාශියක් තිබේ. එයින් පළමුව ලියා ඇත්තේ පැරණි තෙස්තමේන්තුවයි.

ඔබ බයිබලය වසා එහි ඇති පිටු දෙකොටසක් වන සේ මැදින් බෙදූ විට ලැබෙන්නේ ගීතාවලියයි. (Book of Psalms) පැරණි තෙස්තමේන්තුවට අයත් වැඩිපුරම කියවා ඇති පොත්වලින් එකකි. ඒ බයිබලයේ දෙවන අර්ධය නැවතත් හරි මැදින් බෙදූවිට නව තෙස්තමේන්තුව පටන් ගන්නා තැනට ආසන්නයේ ඇති පිටු හමු වේ. දේශනා සහ ඉගැන්වීම් බොහොමයක් සඳහා යොදාගන්නේ නව තෙස්තමේන්තුවයි. මේ පොත් වල නම් කටපාඩම් කරගැනීම ප්‍රයෝජනවත්ය. මේවා ලිවීමට බොහෝ පුද්ගලයන් හවුල් වී ඇත. ඒ සඳහා අවුරුදු ගණනාවක් ගත වී තිබේ. එහෙත් දේව වචනය ඒවායේ ඉතා හොඳින් එකිනෙකට ගැළපී තිබේ.

" මක්නිසාද කිසි අනාගත වාක්‍යයක් මනුෂ්‍ය කැමැත්තෙන් කිසිකලක නොපැමිණියේය. නමුත් මනුෂ්‍යයෝ ශුද්ධාත්මයාණන් විසින් පොලඹවනු ලැබ, දෙවියන්වහන්සේගෙන් ලැබූ ලෙස කථාකළෝය."
(2 පේතෘස් 1:21)

නොයෙක් දෙනාගේ අත්වලින් එවා ලියවී ඇතත් ඒ සියල්ලෙහිම කතුවරයා දෙවියන්වහන්සේ නිසා එවා එකිනෙක හා ඉතා හොඳින් ගැළපේ.

නව තෙස්තමේන්තුවේ ඇති පොත් කාණ්ඩ හතරකට බෙදේ.

ශුභාරංචි (Gospels) යනුවෙන් සඳහන් වන මුල් පොත් හතර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය ගැන අපට කියා දෙයි. මීළඟ පොත අපොස්තුළුවරුන්ගේ ක්‍රියා (Acts of apostles) ය. එය තනි පොතකි. ක්‍රිස්තුස්වහන්සේ ස්වර්ගස්ථ වූ විට උන්වහන්සේගේ ගෝලයන්ට කුමක්විදැයි එහි වාර්තා කොට ඇති අතර පළමු වරට ශුද්ධාත්මය වැගිරීමත් ක්‍රිස්තියානි සභාවේ උපත සඳහන් කොට ඇත. මීළඟ පොත් විසි එකම විස්තර සහිත හා සමහර විට කෙටියෙන්ද ලියා ඇති ලියුම්ය. ක්‍රිස්තු භක්තික ජීවිතය ගැන පුද්ගලයන්ටත් පල්ලිවලටත් (සභාවට) උපදෙස් දීම සඳහා එවා ලියා ඇත.

අවසාන පොත එළිදරව්වය. (Revelation)

ක්‍රිස්තුස් වහන්සේගේ ගෝලයකු වන යොහාන්ට දෙන ලද දර්ශනය එහි අඩංගුය. සභාවේ කටයුතු ගැනද උන්වහන්සේගේ දෙවන වර පැමිණීමේදී සිදුවන සිදුවීම් ගැන ද එහි සඳහන්ය.

ඔබේ බයිබලය අසිරිමත් පොතකි.
" දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා සම්පූර්ණව සියලු යහපත් ක්‍රියා වලට සූදානම්ව සිටින පිණිස දේවානුභාවයෙන් දුන් මුළුලියවිල්ල ඉගැන්වීමටත් තරවටුවටත් හික්මවීමටත් ධර්මිෂ්ඨකම ගැන ගුරුකම් දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ."
**(2 තිමොති 3:16)**

දරුවකු කිරි බීමට ආශා කරන්නාක් මෙන් වැඩෙන ක්‍රිස්තු භක්තිකයාද දෙවියන්වහන්සේගේ වචනයට ආශා කරයි. ක්‍රිස්තු ලබ්ධියට ළදරුවන් වන අයට අධ්‍යාත්මික ජීවිතය නැමති කිරි බඳුන වනුයේ බයිබලයයි. වැඩිහිටි ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ වැඩීමට අවශ්‍ය මාංශය වනුයේ ද බයිබලයයි. ඔබේ බයිබලය දිනපතා කියවීමෙන් එය ඔබගේ ජීවිතයේ කොටසක් කර ගන්න. එහි ඇති රුවන් වැකි කටපාඩම් කර ගන්නා ඔබටත් දාවිත් රජතුමා සමග මෙසේ ප්‍රකාශල හැක. " ඔබගේ ව්‍යවස්ථාවට මම කොපමණ ප්‍රේම කරම්ද දවස මුළුල්ලේම එක මගේ භාවනාවය. " (ගීතාවලිය 119:97)

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හඳුනා ගැනීමට අපි අද ඔබට ආරාධනා කරමු.

**You are Invited to Know Jesus Today.**

**එක්සත් පෙන්ත කොස්ත සභාව,**
**නො. 1 ටෙම්ප්ලර් පෙදෙස, ගල්කිස්ස.**
**දුරකථන : 712615 , 716951**

Apostolische Pfingstgemeinde Mannheim
Friedelsheimerstr. 18-20
D - 68199 Mannheim (Neckarau) /Germany
Pastor Raymond Wey
Assistent Pastor Sascha Wey
www.jesus-is-god.de, www.v-p-m.de